ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2283/41 - 2022 ජුනි මස 10 වැනි සිකුරාදා - 2022.06.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාව සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාවේ අංක 10 - චංකාණෛයි නැගෙනහිර හා දකුණ කොට්ඨාසයට තේරී පත් වූ තම්බිප්පිල්ලෙයි සිවසුබ්‍රමණියම් අයත් වන්නා වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාවේ අංක 10 - චංකාණෛයි නැගෙනහිර හා දකුණ කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ආරුමුගම් සිවකුමාර් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, රාජේන්ද්‍රම් ක්‍රිස්ටි අමල්රාජ් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් ආරුමුගම් සිවකුමාර්, වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාවේ අංක 10 - චංකාණෛයි නැගෙනහිර හා දකුණ කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**ආර්. සී. අමල්රාජ්,**
තේරීම්භාර නිලධාරි,
වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාව.

2022 ජුනි මස 09 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
යාපනය.

EOG 06 - 0097



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ පේදුරුතුඩුව නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහිමිවීම හේතුකොට ගෙන පේදුරුතුඩුව නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ පේදුරුතුඩුව නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ ශ්‍රීවාණි දීපන් අයත් වන්නා වූ ඊලාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරාපත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වුව ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම පේදුරුතුඩුව නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ආදවන් රාජවේනි නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

පේදුරුතුඩුව නගර සභාවේ තේරීම්භාර නිලධාරි, රාජේන්ද්‍රම් ක්‍රිස්ටි අමල්රාජ් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් ආදවන් රාජවේනි, පේදුරුතුඩුව නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**ආර්. සී. අමල්රාජ්,**
තේරීම්භාර නිලධාරි,
පේදුරුතුඩුව නගර සභාව.

2022 ජුනි මස 09 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
යාපනය.

EOG 06 - 0098

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.